# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT


මගේ අංකය : පීඑස්/සීඑස්ජී/00/1/4/1 චක්‍රලේඛ අංක : පීඑස්/සීඑස්ජී/චක්‍රලේඛ/4/2019

2019 දෙසැම්බර් මස 02 වන දින

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,**

**රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව රජයේ කටයුතු කළමනාකරණය**

මහජන මුදල් ප්‍රතිපාදන අරපිරිමැස්මෙන්, උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීත්වයෙන් යුතුව පරිහරණය කිරිම පිණිස අදාළ බලධාරීන් විසින් සෑම ප්‍රයත්නයක්ම ගත යුතු බව අතිගරු ජනාධිපතිතුමා විසින් අවධාරණය කරනු ලැබ ඇත.

ඒ අනුව, ව්‍යවස්ථානුකූලව හා විද්‍යාත්මක පදනමක් මත අමාත්‍යාංශ 30කින් සමන්විතව අමාත්‍ය මණ්ඩලය සකස් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩලයේ ගරු අමාත්‍යවරුන් සංඛ්‍යාව ද සීමා කොට තිබේ.

ඉහත තත්ත්වයන් යටතේ එක් ගරු අමාත්‍යවරයෙකු විසින් අමාත්‍ය ධූරයන් කිහිපයක් දැරුව ද, ජනාධිපති ලේකම් ගේ අංක : සීජ්/1/17/1 හා 2010.05.14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ හා ඊට අදාළ සංශෝධනයන් ප්‍රකාරව <u>එක් කැබිනට් අමාත්‍යවරයෙකුට</u> අදාළ වන්නා වූ වාහන පහසුකම් වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ ගරු අමාත්‍යවරයෙකු වෙත හිමි ගැන්විය යුතු බව කාරුණිකව දන්වමි. එකී චක්‍රලේඛයේ සඳහන් කාර්යය මණ්ඩල, ආරක්ෂක නිලධාරීන් හා අනෙකුත් පහසුකම් ද හැකිතාක් දුරට අවම සිමාවන් යටතේ පවත්වා ගනු ඇතැයි ද අතිගරු ජනාධිපතිතුමා අපේක්ෂා කෙරේ. නව කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් හා එකී කාර්යය මන්ඩලය සඳහා අවශ්‍ය වන කාර්යාලීය පහසුකම් ද දැනට පවතින ඉඩ ප්‍රමාණය ඇතුළත කලමනාකරණය කර ගත යුතුවේ.

තවද, මේ වන විට අමාත්‍ය ධූරයන් නොදරන සියළුම හිටපු ගරු අමාත්‍යවරුන්, කැබිනට් නොවන අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් හා ඔවුන් ගේ කාර්යයය මණ්ඩල වෙත ලබා දෙන ලද සියළුම රජයේ වාහන විධිමත් පරිදි ආපසු භාර ගැනීම සඳහා අවශ්‍ය පියවරයන් ගත යුතුවේ.

එසේම, හැකිතාක් දුරට දැනට පවතින සම්පත් තුළ අවශ්‍යතා කළමනාකරණය කර ගැනීම සිදු කළ යුතු වන බැවින්, එක් එක් ගරු කැබිනට් අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා හා කාර්යය මණ්ඩලය වෙත නියමිත වාහන ප්‍රමාණය භාර දීමෙන් පසුව උක්ත භාර ගත් වාහන අතරින් අමාත්‍යාංශය තුළ වන අතිරික්ත වාහන සංඛ්‍යාලේඛණ ද සහිතව මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත භාර දීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් තවදුරටත් දන්වා සිටිමි.

තම අමාත්‍යාංශයන්හි ප්‍රධාන ගණන් දීමේ නිළධාරී වශයෙන් මෙය ඔබ ගේ රාජකාරිමය වගකීමක් බව අවධාරණය කරන අතර, මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත් :

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති

} කරු. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

4. කොම්ප්ට්‍රෝලර් ජනරාල් - උක්ත අතිරික්ත වාහන ලැයිස්තු ගතකොට විධිමත් පරිදි භාර ගැනීම සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම


ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk